**උතුරු පළාතේ තිරසර ධීවර සංවර්ධනය සඳහා ව්‍යාපෘති සැලසුම්කරණ අත්තිකාරම් සඳහා වන ව්‍යාපෘතිය - 2019**

---

උතුරු පළාතේ තිරසර ධීවර සංවර්ධනය සඳහා **ව්‍යාපෘති සැලසුම්කරණ අත්තිකාරම්** සඳහා වන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 මාර්තු 17 දින එළඹි අංක පීඩීඒ 6011 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 1V ව්‍යවස්ථාවේ 4.04 කොටස සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම ප්‍රකාරව, ධීවර අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීමේ හා අධීක්ෂණයකිරීමේ ඒකකය ව්‍යාපෘතියේ ක්‍රියාත්මකකිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ කාර්යයන් ධීවර වරාය, නැංගුරම් ස්ථාන හා ගොඩබෑම් ස්ථාන පිළිබඳ විස්තරාත්මක සැලැසුම් සිදු කිරීම යන සංරචකය යටතේ ක්‍රියාත්මක වේ. ව්‍යාපාතියේ අරමුණු වන්නේ, ධීවර කර්මාන්තයේ තටිතල පහසුකම් තිරසර උපයොජනය සඳහා ධීවර වරාය, නැංගුරම් ස්ථාන හා ගොඩබෑම් ස්ථාන පිළිබඳ විස්තරාත්මක සැලැස්මක් සිදු කිරීම වේ. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපාතියේ ඇස්තමේන්තුගත මුලු පිරිවැය රු. මිලියන 242.43 කට සමාන එ.ජ.ඩො මිලියන 1.59 ක් වන අතර ඉන් රු. මිලියන 198.13 කට සමාන එ.ජ.ඩො මිලියන 1.3 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කරනු ලැබේ. ඉතිරි මුදල වූ රු. මිලියන 44.217 කට සමාන එ.ජ.ඩො මිලියන 0.29 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතියේ කාර්යයන් 2017 මාර්තු 20 දින ආරම්භ කරන ලද අතර 2018 ජුනි 01 දින වන විට නිම කිරීමට නියමිතය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කාර්යයන් නිම කිරීමේ දිනය 2020 මැයි 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 31 දෙසැම්බර් දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය පිළිබඳ වගකීම දරණ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | -------------------- | ---------- | --------------------------- | ------------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂය තුල රු. 741,582 ක පිරිවැයකට මිලදීගත් කාර්යාල උපකරණ සඳහා වූ ක්ෂය ප්‍රමාණය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | ගිණුම්වල අඩුවෙන් දක්වා ඇත | සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාල උපකරණ ක්ෂය මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොමැත. කෙසේ වුවද, ඊලඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කරනු ලැබේ. | ක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල සහ භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවල පෙන්නුම් කරනු ලබන වියදම් අතර රු. 1,169,422ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි. | ගිණුම්වල නොසැසඳූ ශේෂය | 2018 වර්ෂය සඳහා (රු.මිලියන 67.491) හා 2019 වර්ෂය සඳහා (රු.මිලියන 31.32) මාසික භාණ්ඩාගාර වියදම්වලට එරෙහිව පොදු ලෙජරයේ වියදම් සැසඳූ ශේෂයන්ගේ ප්‍රකාශන | කාලානුරූපව භාණ්ඩාගාර වාර්තා සමඟ ලෙජරයේ ශේෂය සැසඳීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | -------------------- | ---------- | --------------------------- | ------------------------ |
| (අ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව උපදේශන සේවයේ භෞතික අවිනිශ්චිතතාවයේ වටිනාකම කොන්ත්‍රාත් වටිනාකමෙන් 7.5%ක් ලෙස රු.4,643,280 ක් විය යුතු වුවත්, ව්‍යාපෘතිය උපදේශන කොන්ත්‍රාත්තුව රු.6,500,00ක අවිනිශ්චිතතාවයක් සමඟ ප්‍රදානය කර තිබුණි. | ව්‍යාපෘතියේ කාල සීමාව අවසානයේදී ව්‍යාපෘතියේ අවසාන අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වුවද, ව්‍යාපෘති පිරිවැය | උපදේශනය සඳහා වන මූල්‍ය පිරිවැය වශයෙන් අවිනිශ්චිතතාවයන් සඳහා රු.මිලියන 6.5ක් ඇතුලත් කර ඇත. ගණනය කළ විට, ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීමේ හා අධීක්ෂණයකිරීමේ ඒකකය විසින් දෙනු ලැබූ පිරිවැය ඇස්තමේන්තුවෙන් 7.5% කට වඩා රු.මිලියන 6.5 අඩුය. එම නිසා රු.6,500,000ක්වූ උපදේශන ප්‍රතිපාදනයේ ප්‍රතිශතය මුළු පිරිවැය | ලංසු ප්‍රදානය කිරීමේදී, ව්‍යාපෘති ගිවිසුම පරිදි උපදේශන සේවයේ භෞතික අවිනිශ්චිතතාවයට සීමිත විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉක්මවා යනු ඇත. | ඇස්තමේන්තුවෙන් 3.75% ක් පමණි. | |
| (ආ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතේ 12 වන ඡේදය අනුව රේඛීය අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීමේ හා අධීක්ෂණයකිරීමේ ඒකකය විසින් පරිපාලන කාර්යයන් සිදු කළ යුතුයැයි අවශ්‍ය වුවද 2018 ඔක්තෝබර් මාසයේදී ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු සහ තවත් අතිරේක තනතුරු 04ක් බඳවාගෙන තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින දක්වා රු.10,503,600ක පාරිශ්‍රමික ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ කාල සීමාව අවසානයේදී ව්‍යාපෘතියේ අවසාන අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වුවද, ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යනු ඇත. | ධීවර හා ජලජ සම්පත් සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යටතේ පිහිටුවා විය යුතු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් එ.ජ.ඩො මිලියන 201.22 ක පිරිවැයකට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 අගෝස්තු 22 දිනැති අංක ඒඑම්පී/18/1651/825/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. | අතිරේක කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීමේ හා අධීක්ෂණයකිරීමේ ඒකකය මඟින් ව්‍යාපෘතියේ පරිපාලන කාර්යයන් සිදු කර ගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යයන්හි භෞතික ප්‍රගතිය**

| | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2017 මාර්තු 20 දින ව්‍යාපෘතිය එහි කාර්යයන් ආරම්භ කර තිබුණු අතර 2018 ජුනි 01 දින වනවිට සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණ ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව ව්‍යාපෘතියේ කාර්යයන්වල සම්පූර්ණ කරනු ලබන දිනය 2020 මැයි 31 දින දක්වා ණයදෙන නියෝජිතායතනය විසින් දීර්ඝ කර තිබුණි. | ව්‍යාපෘතියේ කාල සීමාව අවසානයේදී ව්‍යාපෘතියේ අවසාන අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වනු ඇත. | පාලනයෙන් තොර හේතු නිසා ව්‍යාපෘති ක්‍රියාකාරකම් කීපවතාවක් දීර්ඝ කිරීමට සිදු වී තිබුණි. ප්‍රධාන වශයෙන් රාජ්‍ය නොවන සංවිධානවල උනන්දුව නිසා පේසාලේ සහ පොයින්ට් පේද්‍රු ධීවර වරායන් ක්‍රියාත්මක කිරීමට එරෙහිව විවිධ පාර්ශ්වයන්ගෙන් විරෝධතා එල්ල විය. | වෙනස්කම් සඳහා හේතුව විමර්ශනය කර නිවැරදිව වාර්තා කළ යුතු අතර අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | පේසාලේ හා පොයින්ට් පේද්‍රු ධීවර වරායන් ඉදිකිරීමේ සැලසුම් සකස්කිරීමෙන් ව්‍යාපෘතියේ කාර්යයන් සමන්විත වී තිබුණි. කෙසේවුවද, ව්‍යාපෘති විෂය පථයේ වෙනස්වීම | ව්‍යාපෘතියේ කාල සීමාව අවසානයේදී ව්‍යාපෘතියේ අවසාන අරමුණු | පිළිතුරු සපයා නැත. | ප්‍රතිනිර්මාණය කිරීමේ සාධාරණත්වය තීරණය කිරීමට වෙනස්කම් සඳහා |

| | | | |
|---|---|---|---|
| හේතුකරගෙන 2019 දෙසැම්බර් 31 දින දක්වා සැලසුම් සකස්කිරීමේ වැඩ සඳහා රු.මිලියන 18.6 ක් වැය කිරීමෙන් පසු 2019 දී පේසාලේ ධීවර වරායේ සැලසුම් සකස්කිරීම ඉවත් කරගෙන තිබුණි. එසේම, පොයින්ට් පේද්‍රු ධීවර වරායේ සැලසුම් වෙනස් කිරීමට ද තීරණය කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබූ කාර්යයන්වල භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් වූ වාර්තා විගණනයට ඉදිරිත් කර නොතිබුණි. | සාක්ෂාත් කරගත නොහැකි වනු ඇත. | | හේතුව තවදුරටත් විමර්ශනය කළ යුතුය. |

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| **විගණන නිරීක්ෂණය** | බලපෑම | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|---|
| ------------------------ | ---------- | --------------------- | ------------------------ |
| වරාය සැලසුම් ඉංජිනේරුවරයා සමඟ වූ උපදේශන කොන්ත්‍රාත් ගිවිසුමට අනුව පිළිවෙළින් ක්ෂේත්‍ර චාරිකා හා නිවස/කාර්යාලීය වැඩ සඳහා දින 75ක් හා දින 30ක් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2017 ජූලි සිට 2019 නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා ක්ෂේත්‍ර වැඩ වෙනුවෙන් දින 38.73ක් හා නිවස/කාර්යාලීය වැඩ වෙනුවෙන් දින 65.98ක් පමණක් ගතකර තිබුණි. ප්‍රතිඵලයක් වශයෙන්, විස්තරාත්මක සැලසුම් සකස් කරන කණ්ඩායම සිදු කරනු ලබන වරාය හා නැංගුරම්පොල සැලසුම්කිරීමේ වැඩ සමාලෝචනය කිරීමටත් තාක්ෂණික පිරිවිතරයන් හා හොඳම ජාත්‍යන්තර භාවිතයන් හා ගිවිසුමේ දක්වා ඇති සියලුම ප්‍රමිති හා පරාමිතීන් සමඟ සැලසුම් කටයුතු සිදු කරන බවට සහතික වීමටත් ප්‍රමාණවත් කාලයක් යෙදවීමට වරාය සැලසුම් ඉංජිනේරුවරයාට නොහැකි විය. | ව්‍යාපෘතියේ කාල සීමාව අවසානයේදී ව්‍යාපෘතියේ අවසාන අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වනු ඇත. | ජාත්‍යන්තර වරාය සැලසුම් ඉංජිනේරුවරයා සමඟ වූ ගිවිසුමට අනුව, ක්ෂේත්‍ර චාරිකා හා නිවස/කාර්යාලීය වැඩ සඳහා දිනක ගෙවීම එ.ජ. ඩො. 785ක් විය. | විස්තරාත්මක සැලසුම් සකස් කරන කණ්ඩායම විසින් සිදු කරනු ලැබූ වරාය හා නැංගුරම්පොල සැලසුම් වැඩ සමාලෝචනය කිරීමට ප්‍රමාණවත් කාලයක් වරාය සැලසුම් ඉංජිනේරුවරයාට සපයා දිය යුතුය. |